# 14
# ළමා රසවින්දනය කෙරෙහි ගුවන්විදුලි මාධ්‍යයේ උපයෝගීතාව පිළිබඳ විමර්ශනයක්

නන්දන මිල්ලගල

ශබ්ද සන්නිවේදනයේ අපූර්වවූත්, අද්විතීයවූත්, ප්‍රබලවූත් විද්‍යුත් තාක්ෂණික මාධ්‍යයක් ලෙස ගුවන්විදුලිය හැඳින්විය හැකිය. සන්නිවේදනාත්මක වශයෙන් ගුවන්විදුලි මාධ්‍ය ප්‍රධාන ආකාර තුනකින් යුක්තය.

1. ශබ්ද මාධ්‍යයක්
2. විද්‍යුත් මාධ්‍යයක්
3. ශ්‍රව්‍ය මාධ්‍යයක්

යනුවෙනි. සන්නිවේදක කේන්ද්‍රීය වශයෙන් ගුවන්විදුලිය ශබ්ද මාධ්‍යයකි. එනම් ගුවන්විදුලි සන්නිවේදකයා ශබ්දය උපයෝගී කරගත් ප්‍රයෝග ඇසුරින් සංදේශකරණයෙහි නියුක්තවීමය. එහිදී භාෂාමය සන්නිවේදන ප්‍රයෝග ගුවන්විදුලියට උචිත ආකාරයට භාවිත කරයි. එසේම සංගීතය ද ගුවන්විදුලි සන්නිවේදනයේ මුඛ්‍යතම ප්‍රකාශන ප්‍රයෝගයකි. භාෂාව ද සංගීතය ද නොවන ස්වාභාවික හා නිර්මිත ශබ්ද ද ගුවන්විදුලි මාධ්‍ය සඳහා භාවිත කළ හැකිය. එසේම නිශ්ශබ්දතාව ද කළමනාකරණය කිරීම ගුවන්විදුලි මාධ්‍යයේදී අත්‍යවශ්‍ය ප්‍රකාශන උපක්‍රමයක් බවට පත්වේ. එබැවින් ශබ්ද ශික්ෂණය මගින් ගුවන්විදුලි සන්නිවේදනය ගොඩනැගේ. එම නිසා ගුවන්විදුලිය ස්වකීය සන්නිවේදනාත්මක වපසරිය නිර්මාණය කරගන්නේ ශබ්දය පදනම් කරගෙන බැවින්, එය ශබ්ද මාධ්‍යයක් ලෙස හැඳින්වීම යෝග්‍යය. එහෙත් "ශබ්දය" ගුවන්විදුලිය නම් වූ සුවිශේෂ මාධ්‍යමය ශක්තිය ලබා ගන්නේ විද්‍යුත් ශක්තිය මගිනි. එනම් ශබ්ද භාවිතයේ පවත්නා සාමාන්‍ය ශබ්ද තරංග (Normal Sound Waves) විද්‍යුත් චුම්බක තරංග (Electro Magnetic Waves) බවට පත් කිරීමයි. එය අද්විතීය ශක්‍යතාවක් බවට පත්ව ඇත්තේ වර්තමානය වන විට එය අන් සියලු මාධ්‍ය කෙරෙහි බලපා ඇති බැවිනි. ඒ අනුව ගුවන්විදුලිය විද්‍යුතය මගින් බලගැන්වූ ශබ්ද මාධ්‍යයක් බවට පත්වේ. එහෙත් ග්‍රාහක කේන්ද්‍රීයව ගුවන්විදුලිය කියවා ගැනීමේදී ශ්‍රවණ මාධ්‍යයක් හෙවත් ශ්‍රව්‍ය මාධ්‍යයක් බවට පත්වේ. එනම් එක්තැනක සිට විසුරුවා හරින ශබ්දමය පණිවිඩ විද්‍යුත් තරංග ඔස්සේ ව්‍යාප්තවී ගෘහස්ථව පවත්නා ගුවන්විදුලි යන්ත්‍ර මගින් ශ්‍රාවකයා වෙත සමීප වීමයි. එයින් ශ්‍රාවකයාගේ ශ්‍රවණේන්ද්‍රිය උත්තේජනයට ලක්වීම මගින් අදාළ පණිවිඩ අර්ථකථනයවේ. ගුවන්විදුලිය ජන මාධ්‍යයක් බවට පත්වීමේ දී මෙසේ පණිවිඩ ජනගතවීම අත්‍යවශ්‍යවේ. එය සිදුවන්නේ ශ්‍රවණ ක්‍රියාවලිය හේතුවෙනි. ගුවන්විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස ප්‍රකටවන්නේ මේ නිසාය.

සන්නිවේදනාත්මක වශයෙන් විමර්ශනය කරන විට ගුවන්විදුලිය සතු ප්‍රබලම ශක්‍යතාව වන්නේ පරිකල්පන උත්පාදන ශක්තියයි. එසේම දුබලත්වය වන්නේ ක්ෂණ භංගුරත්වයයි. එනම් ගුවන්විදුලියෙන් විකාශිත පණිවිඩ සැණෙකින් වා තලයේ මැකීයාමයි. මෙම දෙපාර්ශ්වය අවබෝධ කරගනිමින් ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනය කිරීම වැදගත්වේ. මෙම විමර්ශනයේදී වඩාත් අවධානය යොමු කරන්නේ ළමුන් ඉලක්ක කරගත් වැඩසටහන් කෙරෙහිය.

සෑම පුද්ගලයෙකුම ජීවිතයේ පසු කරනු ලබන එක් කාල පරිච්ඡේදයක් ලෙස ළමා විය හැඳින්විය හැකිය. ළමයා යනු කවරෙක්ද? යන්න පිළිබඳ නොයෙකුත් ක්ෂේත්‍ර ඔස්සේ අර්ථ නිරූපණ ඉදිරිපත් වී ඇත. ළදරුවෙකු

නම් තමාට ඉදිරියේදී පසු කිරීමට ඇති කාල පරිච්ඡේදයකි. ළදරුවියේදී ජීවිතය අවසන් නොකළ සෑම පුද්ගලයකුටම ළමා කාලයක් තිබේ. ඒ පිළිබඳ විවිධ දෘෂ්ටීන්ගෙන් අවධානය යොමුවී තිබේ. පර්යේෂණාත්මක කාර්යයන්හිදී රටක ළමා පරපුර පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වයි. එයට හේතුව එම රටේ අනාගතය භාරගන්නා පිරිස වන්නේ ළමුන් වන බැවිනි. ආචාර්ය අර්නස්ට් ජෝන්ස්ගේ විග්‍රහය අනුව මිනිසාගේ වර්ධනය පිළිබඳ ප්‍රධාන අවස්ථා සතරක් දැක්විය හැකිය.

i. ළදරු අවස්ථාව (උපතේ සිට අවුරුදු 5 දක්වා)
ii. ළමා අවස්ථාව (අවුරුදු 5 සිට අවුරුදු 12 දක්වා)
iii. නව යෞවන අවස්ථාව (අවුරුදු 12 සිට 18 දක්වා)
iv. වැඩුණු අවස්ථා (අවුරුදු 18 ඉක් වූ පසු)

ළමා අවධිය පිළිබඳ පර්යේෂණ සිදු කළ පියාජේ ළමයාගේ බුද්ධි වර්ධනය හා සම්බන්ධව අවධි කීපයක් බෙදා දක්වයි.

1. i. ඉන්ද්‍රීය ක්‍රියාකාරී අවධිය (උපතේ සිට අවු 2 දක්වා)
   ii. පූර්ව ක්‍රියාකාරී අවධිය

2. i. පූර්ව සංකල්ප අවධිය (අවුරුදු 2 සිට 4 දක්වා)
   ii. ප්‍රතිභා චින්තන අවධිය (අවුරුදු 4 සිට 7 දක්වා)

3. ක්‍රියාකාරී චින්තන අවධිය
   i. සංයුක්ත ක්‍රියා අවධිය (අවුරුදු 7 සිට 11 දක්වා)
   ii. විධිමත් ක්‍රියා අවධිය (අවුරුදු 11 සිට 14 දක්වා)

ළමයා පිළිබඳ මහාචාර්ය මුතුලිංගම් දක්වන්නේ ළමා අවධිය නොහොත් පාසල් අවධිය යනුවෙන් සාමාන්‍යයෙන් හැඳින්වෙනුයේ අවුරුදු පහ හෝ හයේ සිට පෙර නව යොවුන් විය දක්වා වූ යුගයයි.

මෙම විමර්ශනය අනුව ළමයා යනු සාමාන්‍යයෙන් අවුරුදු පහත් එකොළහත් අතර වයස් කාණ්ඩයට අයත් වන අය ලෙස සැලකිය හැකිය. සාමාන්‍ය සමාජ ව්‍යවහාරය අනුව දෙමව්පියන්ට තම දරුවන් කුමන වයසක හෝ තරාතිරමක පසු වුවත් ළමුන්ය. එසේම සෑම මිනිසෙකුම 'ළමයා' යන කාල සීමාවට සම්බන්ධවන නිසා සෑම මිනිසෙක් තුළම සැඟවුණු ළමයෙක් ජීවත්වේ. එය පොදු ධර්මතාවකි. මන්දයත් ළමා කාලය යනුවෙන් හඳුනාගෙන තිබෙන ජීවන කාල පරාසය ජීවිතයට අවශ්‍ය බොහෝ මානසික ශක්තීන් අවධිවන, බුද්ධිය අවධිවන, මතකය පොහොසත් වන නිර්මාණාත්මක ජවය රෝපණය වන අවධියක් වන බැවිනි.

ගුවන්විදුලිය නම් ශ්‍රැතිගෝචර මාධ්‍ය ළමුන්ගේ රසවින්දනය මුවහත් කිරීමට ඔප මට්ටම් කිරීමට හෝ ශක්ති සම්පන්න කිරීමට බලපාන ආකාරය ගැන මෙහිදී අවධානය යොමුකළ යුතුවේ. රසවින්දනය වනාහි ආස්වාදයයි. චමත්කාරයයි. සෞන්දර්ය ජනනයයි. ආනන්දයයි. රසභාව ප්‍රබෝධනයයි. මෙය මානවයා ලද අපූර්ව මෙන්ම විශිෂ්ටතම ශක්‍යතාවයි. පෘථිවිතලය සොඳුරු නවාතැන්පළක් වන්නේ මේ නිසාය. අරුණෝදයක, සඳපිපි රැයක, කුසුම ගොමුවක, වනරොදක, ගංගා, ඇල දොළක, පුලින තලයක, විහඟ ගීයක, සිව්පා සැරියක, මදනලක, බිඟු රාවයක, සොඳුරුතා අසන, දකින විඳින මිහිමත සිටින අපූරු සත්ත්වයා මිනිසාම මිස අන්කවරෙක්ද? ඒ තරම් තිරසර දර්ශනයක් නොමැත. ළමයා රසවතෙකු කළ යුත්තේ මෙකී චමත්කාරයෙන් සියොලඟම සුවපත් වන බැවිනි. මානවීයත්වයේ සියලු වටිනාකම් කැටිවී මෙකී රස නිෂ්පත්තිය සිදුවන බැවිනි.

ළමයා තුළ රසභාව ජනනය කරන්නේ සන්නිවේදනය මගිනි. ඇස, කන, නාසය, දිව, ශරීරය, යන ඉන්ද්‍රියන්ට ගෝචරවන, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු මත අවධිවන ස්නායු පද්ධතිය හා මොළය

ආශ්‍රිත රස සංජානනය සිදුවේ. සාහිත්‍ය, සංගීත, නාට්‍ය කාව්‍යාදී සකල කලාවන්ගේ ජාත භූමිය, උල්පත වන්නේ මෙයයි. ජීවිතයේ ළමා කාලය වෙනුවෙන් මෙයින් වැඩි පංගුවක් වෙන්වේ. ''හොඳම දේ ළමුන්ට'' නම් ඔවුන්ගේ රසඥතා සුපෝෂණය හොඳම ත්‍යාගයකි. ළමුන් වෙනුවෙන් දියහැකි ශ්‍රේෂ්ඨ තිළිණයකි. සදාතනික වටිනාකමකි. ළමා සාහිත්‍යයක අනන්‍යතාව මුනිදාස කුමාරතුංගයන් දක්වා ඇත.

''දරුවන්හට මහත් තැනක් නැතිවමැ වැටහෙන

උන්ගේ සිත් පුබුදුවන ඇඟපත නිකම් නටවන

යහළුවන් සමඟින් සසඳන්ට පොළඹවන

උන් කියවනු ඇසූ වැඩි හිටියවුන් පහදවන

විසිතුරු පබැඳුමෙකි එවයසට කිවියෙක් නම්''

පමණක් නොව වැඩිහිටියන් ද ප්‍රසාදයට පත් කළ හැකි වන නිර්මාණයන්, ළමා රසවින්දනයට ගෝචරවන බවයි. ''සරලත්වය, මිත්‍රත්වය, විචිත්‍රත්වය, නොගැඹුරු බව, අදීර්ඝ සන්දර්භය, අලංකාර අඩු බව, අව්‍යාජත්වය, නාට්‍ය ස්වභාවය, සංවාද බහුලත්වය හා රස මිශ්‍ර භාවය යනාදිය ළමා සාහිත්‍යයේ සාමාන්‍ය ලක්ෂණ ලෙස හැඳින්විය හැකිය.''

මෙකී ලක්ෂණ සහිත නිර්මාණවලින් ළමයාගේ රසභාව අවධි කළ හැකිය. එය ප්‍රස්තුත මාතෘකාවට අදාළ ගුවන්විදුලි මාධ්‍යයන්ට ද සාධාරණවේ. ලාංකේය ගුවන්විදුලිය දකුණු ආසියාවේ පමණක් නොව ලෝකයේම සුවිශේෂිත වන එක් කරුණකි. එනම් 1924 සිට හෝ 1925 සිට ගුවන්විදුලිය ස්වකීය සංදේශ මුදාහරින්නේ සියවස් ගණනාවක් පුරා ශ්‍රැතිගෝචර අභ්‍යාසයට ශ්‍රවණ මාධූර්යය යන පරිචයට හුරු පුරුදු වූ ජන කොටසකටය. එම ජාන පරම්පරාවන්ගේ නූතන සමාජයටය. එම අභ්‍යාසය සරල නොවේ. අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, ජාතකපොත්වහන්සේ වැනි ලෝක සම්භාව්‍ය සාහිත්‍යාවලියෙහි කවර තරගයකට වුව ද කරටකර තැබිය හැකි කතා සංග්‍රහයක් අසා සිට වින්දනය කළ ප්‍රජාවකි. එපමණක් නොව මුවදෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ, සඳකිඳුරුදාකව, මයුර, තිසර, පරවි, කෝකිල, ගිරා, සැළලිහිණි, හංස, සැවුල් ආදී සංදේශාවලියක් මෙන්ම, කාව්‍යශේඛරය, බුදුගුණාලංකාරය, ගුත්තිලකාව්‍යාදී සුවිසල් පද්‍යමය නිමැවුම් අසා කියවා රසදත් මුවහත් පරපුරකි. එවන් ශ්‍රාවක සමාජයකට ගුවන්විදුලිය වැනි මාධ්‍යකට වඩාත් පහසුවෙන් නැඹුරුවන්නට හැකිවීම අරුමයක් නොවේ.

අනෙකුත් මාධ්‍යයන් සමග සසඳන විට ළමයාගේ රසමනස් පෝෂණය කිරීමෙහිලා ගුවන්විදුලිය සතු ප්‍රබල හැකියාව විශේෂිතවේ. ශ්‍රවණ මාධ්‍යයක් වන බැවින් භාෂා උපාර්ජනයට යොමුවන වයසේ සිටම ළමයාට ගුවන්විදුලිය සමීපවේ. ළදරු හෝ පූර්ව ළමාවියේ සිටම ගුවන්විදුලියේ එන සංදේශයන් මගින් කෙමෙන් ළමයාගේ රසඥතාව වර්ධනයවේ.

විවිධ කතන්දර කවි, ගී, සින්දු දරුවාට කියාදීමෙන් දරුවා සමග ගායනා කිරීමෙන් ළමයාගේ මනස තුළ ඇඳෙන චිත්‍රය ඇසුරින් සිතේ ඇතිවන සංවේදී නම්‍යශීලී වින්දනය ඔහුගේ ආකල්ප වර්ධනය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කිරීමට සමත් වෙනවා

'නිර්මාණශීලීත්වය නිතරම ළමුන්ගේ ජීවිතය තුළ පවත්නා අතර එය ඔවුන්ගේ ක්‍රීඩා චිත්‍ර, කවි සහ සුරංගනා කතාවලින් විද්‍යමානවේ. එය වර්ධනය වන්නේ කවර අවස්ථාවක ද? එහි අරුත කුමක්ද? ළමයාට එය අවශ්‍ය වන්නේ කුමක් සඳහා ද? මේරූ ශිල්පියකුගේ කාර්යය සහ ළමා නිෂ්පාදන අතර වෙනස පිළිබඳ ගැටලු කාගේ පරිකල්පනය වඩා පොහොසත් ද සහ නිර්මාණශීලීත්වය වර්ධනය කිරීමට හැකිද? සහ අවශ්‍ය ද යන ගැටලු සංකීර්ණ බවින් අඩු නොවේ''

ගුවන්විදුලි මාධ්‍ය පරිකල්පනය පිළිබඳ මාධ්‍යයක් නිසා ළමා ශක්‍යතා වර්ධනයේදී අපට එයින් ලද හැකි පිටිවහල සෙසු හැම මාධ්‍යයකටම වඩා ප්‍රබලය. සෞන්දර්ය අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ළමා ශක්‍යතා වර්ධනය කිරීමේ තත් කාර්යයෙහිදී ගුවන්විදුලියේ ජනප්‍රියත්වය මෙන්ම සමීපත්වය ද අතිශයින් ප්‍රයෝජනවත් වෙයි.

මෙවැනි මතවාද මගින් ප්‍රකටවන්නේ ගුවන්විදුලි මාධ්‍යයේ ළමුන් විෂයෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වැඩසටහන්කරණය වැදගත් වන බවයි. එය පාර්ශ්ව ගණනාවකින් ළමයා විෂයෙහි ද එම ළමුන් කල්යාමේදී සාමාජීයකරණය වූ විට ඔවුන්ගෙන් සැදුම්ලත් සමස්ත සමාජය විෂයෙහි ද බෙහෙවින්ම ප්‍රයෝජනවත්වේ. අප වැනි රටක වඩාත් සුඛනම්‍ය ලෙස භාවිත කළ හැකි ගුවන්විදුලිය වැනි මාධ්‍යයක් ළමා ප්‍රජාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම සමාජය හරාත්මක දිශානතීන් වෙත හැරවීම කෙරෙහි බලපායි.

අධිරාජ්‍යවාදී යුගයේ ආරම්භ වූ මෙරට ගුවන්විදුලි මාධ්‍ය 1935 පමණ සිට ළමා වැඩසටහන් විකාශනය කර ඇත. 1935 මැයි මාසයේ පමණ සිට සෑම සතියකටම බදාදා දිනවල ප.ව. 6.30 7.00 දක්වා පැය භාගයක ගුවන්කාලයක් ළමයින් සඳහා වෙන්කර තිබිණි. මෙම ළමා වැඩසටහන කර්ක් නැන්දාගේ මෙහෙයවීම යටතේ ප්‍රචාරය වී ඇත.

අඩපැයක් ළමුන් වෙනුවෙන් වෙන්කිරීම ප්‍රමාණවත් නොවුණ ද? ආන්ටි ජෙනී විසින් මෙහෙයවූ මෙම වැඩසටහනට 1936 වන විට පැයක පමණ කාලයක් ලබාදීම ද වැදගත්වේ. මෙවැනි වැඩසටහන් ළමුන් ඉලක්ක කරගත්ත ද එහි ඵලය දීර්ඝකාලීනව අනාගත සමාජය සඳහාය. එම වැඩසටහන්වල අරමුණ වී ඇත්තේ ළමුන්ගේ නිර්මාණාත්මක ශක්‍යතා ප්‍රවර්ධනයයි.

''ළමාවිය සහ ළමාවියේදී ඇතිවන සිතුම් පැතුම්වලට මුල්තැන දෙමින් වැඩසටහන් සැකසීම මුඛ්‍ය අරමුණ වී ඇති බව පෙනීයයි. විවිධ ළමා වැඩසටහන් තුළින් ළමා සිත් සතන් ඒ වෙතට යොමුකර ගැනීම මෙන්ම හැකි තරම් ළමා ක්‍රියාකාරකම් හා සහභාගීත්වයට ප්‍රධාන තැනක් දීම තවත් අරමුණක් බව ද පෙනී යයි.''

ප්‍රථම සිංහල ළමා වැඩසටහන 1936 දී නිර්මාණය කර ඇත. එය මෙහෙයවා ඇත්තේ කැතරින් හපුගල මහත්මියයි. ''සිරියලතා නැන්දා'' යන නමින් වුවත් පසුව පී.ජී. ආරියරත්න විසින් ඉදිරිපත් කළ බැවින් ''ආරියරත්න මාමා'' යනුවෙන් ප්‍රකට වී ඇත. විරිදු ගායනාවලට එක් වූ චන්ද්‍ර රන්ගොට් මෙනවිය, ''දමයන්ති අක්කා'' යනුවෙන් පෙනී සිට ඇත. 1941 යූ. ඒ. එස්. පෙරේරා ''සිරි අයියා'' යනුවෙන් පෙනී සිටිමින් මෙහෙයවූ ''ළමා පිටිය'' එකල ළමුන් වූ, පසු කාලීන විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධ ශිල්පීන් ගණනාවක් බිහිකිරීමේ තිඹිරිගෙය බවට පත්විය. ළමා පිටියේ තේමා ගීතය වූයේ,

සඳුන් කස්තුරි කපුරු සුවඳින්
සුළඟ හමාවී
තුරුලිය රිකිලි නිමාවී
මිහිරි හඬින් කවි, ගී අහගන්ට කැමැත්තෝ
ළමා තීරෙ කියවෙන කියවන්ට හිතැත්තෝ
එනමෙන් පැණි බොන්ට කුරුල්ලා
සුළඟට නටන ලතාවෝ සිත පිනවයි
සරත් කාලෙ පෝය දාක පුන් සඳපානේ
සිරිය තිබෙයි හිනැහෙන පොඩි ළමයගෙ මූනේ
ළමා අයගෙ තීරේ
රසය කාටත් තේරේ

මෙම තේමාවට සාධාරණය ඉෂ්ට කරමින් සුවිසල් ළමා පරපුරකගේ රස මනස් අවදි කිරීමට සමත් වූ ළමා තීරය හෙවත් ළමා පිටිය, ගුවන්විදුලිය, වේදිකාව, සිනමාව පමණක් නොව රූපවාහිනිය පවා ජයගත්

ශිල්පීන් ශිල්පිනියන් ගණනාවක් නිර්මාණය කළ තක්ෂලාව බවට පත්විය. එය මෙහෙය වූ කරු අයියා සහ ළමා පිටිය ජාතික සලකුණු (National Icons) බවට පත්ව ඇත. එසේම සරස්වතී මණ්ඩපය, කණිටු සරසවිය, ළමා සරසවිය, ළමා සංග්‍රහය, මල් කියන්නෙ කාට කාට, බෝසත් ළමා ළපටියෝ, සාදු සමාජය, ශාන්ති මෙන්ම මෙරට දීර්ඝතම ළමා වැඩසටහන ලෙස අදටත් විකාශනය වන හඳමාමා ළමා සමාජය සුමනා ජයතිලක විසින් මෙහෙයවා ඇත. ''පුරවැසියකු වශයෙන් ජීවත්වීමේදී අනාගතයේදී මුහුණදිය යුතු අභියෝගාත්මක දුෂ්කරතා ජය ගැනීම උදෙසා අද දරුවා හුරු කළ යුතුය. එකී උත්තරීතර අපේක්ෂාවෙන් සම්පාදනය වූ නිර්මාණශීලී වැඩ සටහන් එක්තරා අනාගත ආයෝජනයක් ලෙස හඳුන්වාදිය හැකිය. ඉදිරිපත් වීමේ හැකියාව වර්ධනය හා පුරුෂාර්ථ වර්ධනය උදෙසා එය බෙහෙවින් බලපානු ඇත.

එසේම විදුල යනුවෙන් ආරම්භ කර ඇති ළමා ගුවන්විදුලිය, ළමයින් සඳහා ඉලක්කගත නිර්මාණශීලී වැඩසටහන් ගණනාවක් ප්‍රචාරය කරයි. එහි එන රුවනාර ළමා සමාජය, සමනල ලන්ද ආදී වැඩසටහන්වලින් ළමා රසඥතා වර්ධනයට නොමඳ පිටිවහලක් ලැබී ඇත.

ළමා රසවින්දනයට යෝග්‍ය වැඩසටහන් සඳහා ගුවන්විදුලිය වැනි මාධ්‍යයකට යොමු කිරීමේදී ළමයා රූපවාහිනිය හෝ නවමාධ්‍ය භාවිතය සඳහා යොමු වීමෙන් ලද වෙහෙස සමනය කර ගැනීමට හැකිවේ. ''ආනන්දයෙන් පටන්ගෙන ප්‍රඥාවෙන් අවසන් කිරීම'' යන මූලධර්මය අනුව විභව, අනුභාව, ව්‍යභිචාරීභාව සංයෝගයෙන් රස නිෂ්පත්තිය යනු ආනන්දයෙන්, සෞන්දර්ය ආස්වාදයෙන් පමණක් සීමානොවේ. එය ප්‍රඥාව අවධිකර ගැනීමේ ද්වාරය බවට පත්වේ. බුද්ධි වර්ධනය, පෞරුෂත්ව සංවර්ධනය, චරිත සංවර්ධනය, අන්තර් ඥානය, සමාජ සම්බන්ධතා වර්ධනය, සදාචාර සංවර්ධනය, ජීවිත පරිඥානය, රුචිකත්ව කළමනාකරණය, සංස්කෘතික සම්ප්‍රේෂණය ආදී බොහෝ වූ පරමාර්ථ සාධනයට ශක්තිමත් පාලමක් බවට රසවින්දනය යොදාගත හැකිය.

ළමයා කුමන අධ්‍යාපන හෝ වෘත්තීය ක්ෂේත්‍රයකට යොමු වුව ද, ජීවිතයට අවශ්‍ය ශික්ෂණය ළඟා කරගැනීම එකී ක්ෂේත්‍රවල සාර්ථකත්වයට පත්වීමට බලපායි. එය ශ්‍රැතිගෝචර මාධ්‍යයක් වන ගුවන්විදුලිය ඔස්සේ වඩාත් සුමට හා සුගම ආකාරයට සිදු කළහැකිය. ගුවන්විදුලිය ළමා රසවින්දනය පෝෂණය කිරීමේදී අන් සියලුම මාධ්‍යවලට වඩා ඵලදායකය. අතුරු ආබාධවලින් තොරව ළමා මනස සුවපත් කළ හැකි මාධ්‍යවන්නේ ගුවන්විදුලිය බව මෙයින් ප්‍රකට වේ.